ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - **2022**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ජේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් ආයතනය සතු වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කිරීමට විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් මෙම කාර්ය සිදුකිරීම ගැටළු සහගතව පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ වේගවත් කිරීමේ සංවර්ධන වැඩසටහන (AHEAD) ව්‍යාපෘතිය මඟින් ලැබී තිබූ එකතුව රු.667,177,005 ක මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | උපකරණ හා පශ්චාත් උපාධි වැඩ සටහන් වෙනුවෙන් ගිණුම් සටහන් කිරීමට හැකි නමුත්, සිවිල් වැඩ සඳහා තවදුරටත් ගොඩනැගිලි වැඩ නිමකර භාර නොදී ඇති තත්වයන් තුළ ගිණුම්ගත කිරීම ගැටළු සහගත බව. | ව්‍යාපෘතියෙන් ලැබී ඇති මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී මහනුවර උසස් තාක්ෂණ ආයතනයේ සිදු වූ හදිසි ජල ගැලීමෙන් හානියට පත්වූ ගබඩාවේ හා කාර්යාලයේ භාණ්ඩ අයිතම් වර්ග 118 ක වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපීම් කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු අගයන් පදනම්කරගෙන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව . | හානියට පත්වූ අයිතම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | යන්ත්‍ර, පරිගණක, ලී බඩු හා කාර්යාල උපකරණ | 45,678,090 | 633,670 | 45,044,420 | ඉදිරියේදී එවැනි අතපසුවීම් වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | අතපසුවීම් වළක්වා නිසි පරිදි ගිණුම් තැබීම කල යුතුය. |
| (ආ) | ආපදා ණය | 38,052,194 | 38,657,905 | 605,711 | විෂය භාර කළමනාකරණ සහකාර විසින් සකස්කරන ලද උප ලේඛනයේ වෙනසක් සිදුවී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අනුව ශේෂ සැසඳිය යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 502(2) ජේදය | සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.10,098,028,652 ක් වූ දේපළ , පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මු.රෙ.502 (2) ජේදය අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම සඳහා මේ වන විට කටයුතු සැලසුම් කරමින් පවතින බව. | ආයතනය සතුව පවතින වත්කම්වල අගය නිශ්චිතව හඳුනාගැනීමට හැකිවන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෑගල්ල උසස් තාක්ෂණ ආයතනයේ ගනුදෙනු සඳහා යොදා ගැනෙන ජංගම බැංකු ගිණුමට අදාල 2022 ජනවාරි සිට 2023 අප්‍රේල් දක්වා බැංකු වාර්තා පරීක්ෂා කිරීමේදී, සෑම මාසයකම රු.මිලියන 02 සිට රු.මිලියන 06 දක්වා පරාසයක ශේෂයක් රැඳි පැවතුණි. ජංගම ගිණුමේ පවතින ශේෂ සඳහා පොලී මුදලක් ද නොලැබෙන බැවින් දෛනික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් ගිණුමේ රඳවාගෙන අතිරික්ත මුදල් නිසි අනුමැතියක් මත ඉතිරි කිරීමේ ගිණුමක හෝ කෙටි කාලීන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කළමනාකරණයේ අවධානය යොමුව නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ඌන උපයෝජිත මුදල් ආයතනයේ අරමුණු සඳහා යෙදවීමට හෝ ආයෝජනය කිරීමට හෝ කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.115,032,758 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.132,500,160 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,467,402 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් වියදම්, ගිවිසුම්ගත සේවා, නඩත්තු වියදම්, පුහුණු වියදම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිවි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමක් වෙත 2016 වර්ෂයේදී රු.36,989,498 ක අත්තිකාරම් මුදලක් සහ රු.13,941,163 ක අන්තර් ගෙවීමක් කර තිබුණි. ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් පැන නැගුණු නීතිමය ගැටලු හේතුවෙන් 2017 වර්ෂයේ සිට මෙම ඉදිකිරීම් කටයුතු නවතා තිබූ අතර මේ සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | 2022.12.23 වන දින මේ සම්බන්ධව Zoom සාකච්ඡාවක් නීතිපති දෙපාර්තමේන්තුව සහ නඩුවට සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ නීති නිලධාරී පවත්වා ඇත. නීතිපති දෙපාර්තමේන්තුව යළිත් එම නඩුව 2023.07.27 වන දින කැඳවන බව දන්වා එවා ඇති බව. | ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව ඉදිකිරීම් සිදු කිරීමට බලය දුන් නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනයට අදාල ප්‍රසම්පාදන නීති රීති හා මුදල් රෙගුලාසි උල්ලංඝණය කිරීම සම්බන්ධව ආයතනයේ සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා හා නිලධාරීන් 08 දෙනෙකු 2018 වර්ෂයේදී චෝදනාවට ලක්වීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කිරීමටත් නිලධාරීන් 08 දෙනා ස්ථාන මාරු කිරීමත් සිදු කර තිබුණද එම නිලධාරීන්ට එරෙහිව අදාල විනය ක්‍රියාමාර්ග 2023 ජුනි 09 දින වනවිටත් අවසන් කර නොතිබුණි. | ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් කටයුතු කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබූ අතර අනෙකුත් නිළධාරින් 8 දෙනාට එරෙහිව පැවති විධිමත් විනය පරීක්ෂණ මේ වන විට අවසන්ව ඇති අතර හැකි ඉක්මනින් එම වාර්තාව ලබා දෙන ලෙසට විනය පරීක්ෂණ නිලධාරීන් වෙත දන්වා ඇති බව. | නීති රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් 04 දෙනෙකුට 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) මගින්, 2014 හා 2015 වර්ෂවලදී රු.1,371,400 ක් ගෙවා තිබුණද එම නිලධාරීන් පාඨමාලා හැදෑරීම සිදුකර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් වැයකරන ලද මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකරගැනීමට අදාලව කටයුතු කරන බව. | ප්‍රමාදයකින් තොරව අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 වර්ෂයේදී රු.5,915,000ක මුදලක් වැයකර මහනුවර උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සවිකර ඇති සූර්ය බලශක්ති පද්ධතිය 2021 ඔක්තෝම්බර් මාසයේ සිට අක්‍රිය වී තිබූ අතර එය සවිකරන ලද ආයතනය විසින් නිෂ්පාදන දෝෂ සඳහා වසර 10ක කාලයක් හා සියයට 80ට වැඩි විදුලිබල කාර්යක්ෂමතාවයක් වෙනුවෙන් වසර 25ක වගකීම් කාලයක් ලබා දී තිබුණද යථා තත්ත්වයට පත්කර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිලාභ ආයතනයට ලබාගත නොහැකි වී | අදාල සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපිත කරන ලද J.Lanka සමාගම වෙත නිසි පරිදි අදාල සේවාවන් සහ නවීකරණ සිදුකරන ලෙස දන්වා සිටියත්, ඔවුන් ඒ සඳහා දක්වන උනන්දුව සතුටුදායක මට්ටමක නොමැති බව. | වගකීම් කාලය තුළ පවතින දෝෂ යථාතත්ත්වයට පත්කර ගෙන පද්ධතියෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ අතර ක්‍රියාකාරී වසර 6 තුළ රු.1,056,918ක විදුලි උත්පාදන ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. | | |
| (ඉ) | දඹවෙල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම නිමකර 2020 සැප්තැම්බර් 18 දින ආයතනය වෙත භාර දී තිබුණද එහි අධ්‍යයන හා පරිපාලන කටයුතු ආරම්භ කිරීම 2022 ජූනි දක්වා ප්‍රමාදවීම නිසා 2021 ජනවාරි සිට 2022 මැයි මාසය දක්වා ජලය,විදුලිය,පවිත්‍රතා හා ආරක්ෂක සේවා සඳහා වැයකර තිබූ රු.4,983,214ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | කොවිඩ් 19 තත්ත්වය ව්‍යාප්තවීම නිසා දිවයිනේ සියලුම උසස් තාක්ෂණ ආයතනයන්හි සිසුන් කැඳවීමක් සිදු නොවුනු අතර 2022 සැප්තැම්බර් සිට සිසුන් කැඳවා අධ්‍යයන කටයුතු සිදු කරන ලද බව. | අධ්‍යයන කටයුතු සීමා වී තිබූ කාලය තුළ වියදම් අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විදුලි වියදම අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතියක් සවි කිරීමට අදාල මූලික කාර්යය රු.19,784,000 ක් වැයකර 2019 ජූනි 07 දින නිමකර තිබුණද පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට 2023 ජූනි 09 දින දක්වා ආයතනය අපොහොසත් වී තිබීම හේතුවෙන් 2019 ජූනි සිට 2022 දෙසැම්බර් 31 දක්වා ආයතනයේ විදුලිය වෙනුවෙන් රු.4,445,646 ක මුදලක් දැරීමට සිදු වී තිබුණි. | පාලක සභාව විසින් ලබාදුන් උපදෙස් අනුව තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට අදාළ පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවලංගු කර නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයකු හා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ප්‍රසම්පාදන කමිටුවේ නව සභාපතිවරයා පත්කර දෙන මෙන් අමාත්‍යාංශයට ඉල්ලීමක් කර ඇති බව. | තොග විදුලි සම්බන්ධතාවය කඩිනමින් ලබාගෙන ආයතනික විදුලි වියදම අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් රු.18,305,976 ක් වටිනා රත්නපුර පිහිටි ඉඩම, නිල නිවාසයක් හා ක්‍රීඩා පිටියක් තැනීම සඳහා භාවිතයට ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට රු.1,000,000 ක් 2016 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණද ඉතිරි මුදල ගෙවීමට 2023 ජූනි 09 දින වන විටත් නොහැකි වී තිබීම නිසා වර්ෂ 06 ක කාලයක් තුල එම ඉදිකිරීම සිදු කිරීමට නොහැකි වීමෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇති රු.1,000,000 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ඉතිරි රු.මිලියන 17 ගෙවීමට ප්‍රමාණවත් මුදල් මහාභාණ්ඩාගාරය නිදහස් කර නොමැති නිසා මෙම ප්‍රමාදය සිදුවී ඇති බව . | රජයේ අරමුදල් නිෂ්කාර්යව වියදම් දැරීම සිදු නොකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්තකාල කටයුතු නව තාක්ෂණයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා KOHA පරිගණක පද්ධතිය සඳහා උපකරණ මිලදී ගැනීම හා වැඩ මුළු පැවැත්වීම වෙනුවෙන් රු.1,013,315 ක් වැය කර තිබුණද මෙම පද්ධතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | KOHA පරිගණක පද්ධතිය සම්බන්ධ වැඩමුළු පැවැත්වීම, උපකරණ මිලදි ගැනීම ප්‍රධාන කර්යාලයෙන් සිදුකරන ලද අතර, එම පරිගණක දත්ත පද්ධතිය සම්බන්ධයෙන් පවත්වන ලද වැඩමුළු වලට අදාළ දත්ත ඇතුළත් කිරීම් මේ වන විට සිදුකර අවසන් වී ඇති බව. | රජයේ අරමුදල් නිෂ්කාර්යව වියදම් දැරීම නොකල යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමේ අරමුණද සහිතව, 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ අදියර දෙකකින් පස්මහල් ගොඩනැගිල්ලක් දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකිරීමට කටයුතු කර තිබුණි. 2015 අගෝස්තු 26 දින වැඩ ආරම්භ කර රු. 20,486,321 ක් වැයකර මහල් 03 ක වැඩ නිමකර 2017 පෙබරවාරි 21 දින ආයතනය වෙත භාර දී තිබුණි. ඉතිරි මහල් 02 හි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් එම ගොඩනැගිල්ල භාර දුන් දිනයේ සිට නිෂ්කාර්යව පැවතුණි. අපේක්ෂිත පරිදි ගොඩනැගිල්ල නිම නොවීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2017 මාර්තු සිට 2022 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් රු.55,101,948 ක කුලී වියදමක් ආයතනයට දැරීමට සිදු වී තිබුණි. | පළමු අදියරේ මහල් තුන භාවිතයට ගැනීමට නම් ගොඩනැගිල්ලේ තවත් කටයුතු කිහිපයක් කල යුතුව ඇත. කුලී පදනම මත සිටින ගොඩනැගිල්ලේ ගිවිසුම සම්බන්ධව සාකච්ඡා කිරීමට කමිටුවක් පත්කර ඇති අතර, කමිටුවේ නිර්දේශය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | ගොඩනැගිලි ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |